Australian Government

COVID-19 VACCINATION

# හතරවන COVID-19 එන්නත් මාත්‍රාව

2022 ජූලි 8

ශීත සෘතුවේදී COVID-19 වැනි ශ්වසන පද්ධතියට බලපාන ආසාදන බහුලව ඇතිවේ. COVID-19 ආසාදනයට එරෙහිව උපරිම ආරක්ෂාව සඳහා, COVID-19 හේතුවෙන් දැඩි ලෙස රෝගාතුරවීමේ වැඩි අවදානමක් ඇති අය හට අමතර COVID-19 එන්නත් බූස්ටර් මාත්‍රාවක්, නැතිනම් හතරවන මාත්‍රාවක් නිර්දේශ කරයි. දරුණු ලෙස ප්‍රතිශක්තිකරණය හීනවී ඇති අය සඳහා මෙය පස්වන COVID-19 එන්නත් මාත්‍රාවවේ.

පහත අවස්ථාවල COVID-19 හතරවන එන්නත් මාත්‍රාවක් ලබාගත යුතුය:

- අවුරුදු 50 හෝ ඊට වැඩි
- වැඩිහිටි නිවාසයක හෝ ආබාධිත රැකවරණ මධ්‍යස්ථානයක ජීවත් වන පුද්ගලයෙක්

පහත අවස්ථාවල වයස අවුරුදු 16 ට වඩා වැඩි අය හට අමතර බූස්ටර් මාත්‍රාවක්ද නිර්දේශ කරයි:

- ඔබගේ ප්‍රතිශක්තිකරණය හීනවී ඇතිනම්
- සමහර පිළිකා ඇතිනම් පිළිකාවකින් සුවපත්වී ඇතිනම්
- ප්‍රතිකාර අවශ්‍ය වන ඔටෝ ඉමියුන් රෝගයක් ඇතිනම්
- ඔබගේ පෙනහළු, අක්මාව, වකුගඩු, මොළය, හෝ හෘදය වස්තුවට බලපාන නිදන්ගත හෝ දරුණු ආසාදනයක් ඇතිනම්
- බෙහෙත් අවශ්‍ය වන දියවැඩියාව තිබීම
- සැලකිය යුතු හෝ සංකීර්ණ සෞඛ්‍ය අවශ්‍යතාවයක් සහිත ආබාධිත බවක් තිබීම
- දරුණු ලෙස බර වැඩිවීම හෝ බර අඩුවීම.

වයස අවුරුදු 30 සිට 49 අතර අය විසින් ඔවුනට කැමතිනම්, හතරවන මාත්‍රාවක්ද ලබාගත හැකිය.

ඔබ විසින් හතරවන එන්නත් මාත්‍රාවක් ලබාගත යුතුද යන්න පැහැදිලි නැතිනම්, ඔබගේ වෛද්‍යවරයා සමඟ කථා කරන්න.

ඔබගේ COVID-19 බූස්ටර් මාත්‍රාව ලබාගෙන **මාස 3** කට වඩා වැඩිනම්, ඔබගේ හතරවන එන්නත් මාත්‍රාව ලබාගත හැකිය.

ඔබට COVID-19 එන්නත සමඟ ඉන්ෆ්ලුවෙන්සා එන්නත එකවර ලබාගත හැකිය.

ඔබව COVID-19 ආසාදනය ඇති බවට මෑත කාලීනව පරීක්‍ෂණයකින් සනාථවුණි නම්, ඔබගේ මීළඟ COVID-19 එන්නත් මාත්‍රාව ලබා ගැනීමට පෙර **මාස 3** ක් බලා සිටීම නිර්දේශ කරයි.

වැඩි විස්තර සඳහා www.health.gov.au වෙත පිවිසෙන්න එසේ නැතහොත් 1800 020 080 ඔස්සේ National Coronavirus Helpline අමතන්න. නොමිළේ පරිවර්තන සේවා ලබා ගැනීම සඳහා 8 වන විකල්පය තෝරා ගන්න.